**බෙස්ලයින් මාර්ග ව්‍යාපෘතිය - අදියර III 2017**

**----------------------------------------------------------------**

බෙස්ලයින් මාර්ග ව්‍යාපෘතිය - අදියර III 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.මෙම ව්‍යාපෘතිය 2009 නොවැම්බර් 19 දින පවත්වන ලද කැබිනට් අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී ගත් තීරණයක් යටතේ ක්‍රියාත්මක කරන ලදි.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**--------------------------------------------------------------------------------------------------**

එවකට මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග ,මාර්ග සංවර්ධන සහ ඛණිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ කිරුළපන සිට කොළඹ හොරණ මාර්ගය දක්වා මීටර් 840 ක් දිග නව මාර්ගයක් නිර්මාණය කිරීම මඟින් මාර්ග තද බදය අවම කිරීමයි.ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු. මිලියන 4,336 ක් වන අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යායනය කරනු ලබයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**---------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**---------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මුල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් හා ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මුල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව

**2. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**2.1 මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට හා මා හට සපයන ලද තොරතුරු හා මා හට ලබාදුන් පැහැදිලි කිරීම් අනුව මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**-------------------------------------------**

**3.1 අරමුදල් උපයෝජනය**

**-----------------------------**

ලද තොරතුරු අනුව ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා 2017 වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු. මිලියන 600 ක් වෙන්කර තිබුණු අතර රේඛීය අමාත්‍යාංශය විසින් රු. මිලියන 575 ක මුදලක් වෙනත් ව්‍යාපෘති වෙත පසුව මාරුකර තිබුණි.තවද ප්‍රවර්තන වර්ෂය තුළ රු. මිලියන 15.58 ක ප්‍රතිපාදන මුදලක් ව්‍යාපෘතිය විසින් පසුගිය වර්ෂවල ඇතිවූ වගකීම පියවීම සඳහා භාවිතා කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බේස්ලයින් මාර්ගයේ කිරුළපන සිට දුටු ගැමුණු හංදිය දක්වා නැවත ඉදිකිරීමට 2009 වර්ෂයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතියේ කටයුතු ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු නිසා 2012 වර්ෂයේ සිට අත්හැර දමා තිබිණි. 2017 දෙසැම්බර් 31 දිනට හෙක්ටයාර් 0.3691 ක ප්‍රමාණයකට අයත් ඉඩම් කැබලි 11 ක් පමණක් අත්පත් කරගෙන තිබූ බව නිරීක්ෂණය විය. එසේ වුවත් හෙක්ටයාර 2.7283 ක ප්‍රමාණයකට අයත් ඉඩම් කැබලි 143 ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කර තිබුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිවාස යෝජනා ක්‍රමයක් සැලසුම් කිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත 2008 වර්ෂයේදී රු. මිලියන 1.17 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් සැලසුම් නිර්මාණය කිරීමේ කටයුතු 2017 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබුණි. විගණනයේදී එවැනි නිවාස යෝජනා ක්‍රමයක අවශ්‍යතාවය ව්‍යාපෘතියේ විෂයපථයේ කොටසක් ලෙස විගණනයේදී සාධාරණීය කිරීමට නොහැකි විය.

**3.3 ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීම**

---------------------------------------

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අඩු කර තිබුණු අතර ඒ ක්‍රියාකාරකම් වල ඉතා අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. කෙසේ වෙතත් ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍යායතනය විසින් ව්‍යාපෘතියේ කටයුතුවල අඛණ්ඩතාවය සහ කටයුතු අවසන් කිරීමට ඇති හැකියාව සමාලෝචනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.සාමාන්‍ය අංගයක් ලෙස ව්‍යාපෘතිය යටතේ වාර්ෂික ඇස්තමේන්තු මඟින් සිදු කරන ලද වෙන් කිරීම් රේඛීය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරවන ලද වෙනත් ව්‍යාපෘති වෙත මාරු කර තිබුණි.